**<u>ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2021(2024)</u>**

උක්ත තරඟ විභාගයේ ප්‍රතිඵල මත 2025.01.03 දිනැතිව අමාත්‍යාංශයීය වෙබ් අඩවියේ පළ කරන ලද අයදුම්කරුවන්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම වෙනුවෙන් පවත්වනු ලබන සාමාන්‍ය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාවේ “10.2.6” වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව 2025 පෙබරවාරි මස 08, 09, 15 සහ 16 යන දිනවල දී කොළඹ 07, නිදහස් චතුරශ්‍රයේ පිහිටි රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ දී පවත්වනු ලැබේ. එක් එක් අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන දිනය සහ වේලාව ඇතුළත් කැඳවීම් ලිපි ලියාපදිංචි තැපැල මඟින් යොමු කරනු ලැබේ.

02. ශ්‍රී ලංකා පරිපාලන සේවයට පත්කරනු ලබන්නේ ලිඛිත පරීක්ෂණයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල මත බැවින් ඉහත සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වීම මත පමණක් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ තනතුරකට පත් කරනු ලැබීම සඳහා කිසිදු හිමිකමක් නොලබන බව අවධාරණයෙන් සඳහන් කරමි.

03. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් හා අමතර ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතු අතර, එම ඡායා පිටපත් සත්‍ය පිටපත් බවට ඔබ විසින් පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ දී සහතික කර භාර දිය යුතුය.

(අ) මූලික සුදුසුකම් සනාථ කෙරෙන සහතික (උප්පැන්න සහතිකය, උපාධි සහතිකය සහ සවිස්තරාත්මක ප්‍රතිඵල ලේඛනය)

(ආ) ජාතික හැඳුනුම්පත

(ඇ) නමෙහි වෙනසක් ඇත්නම් ඒ පිළිබඳව දිවුරුම් ප්‍රකාශයක්

(ඈ) ඔබ පදිංචි කොට්ඨාශයේ ග්‍රාම නිලධාරියාගෙන් ලබා ගන්නා පදිංචිය හා චරිතය පිළිබඳ සහතිකය (ඩී.එස්. 4 ආකෘතිය මඟින් විය යුතුය.)

(ඉ) මෙම කැඳවීම් ලිපිය

04. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

(අ) අංක 1842/2 දරන 2013.12.23 දිනැති ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාව පරිදි, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය 25කි. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව විභාග නිවේදනයේ ද සඳහන් කළ පරිදි ඔබගේ කුසලතා සඳහා ලකුණු වෙන් කර ඇති ආකාරය පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| I. | කළමනාකරණ කුසලතා | - | 10 |
| II. | නායකත්ව ගුණාංග | - | 05 |
| III. | සන්නිවේදන කුසලතා | - | 05 |
| IV. | පෞරුෂත්වය | - | 05 |

(ආ) සමාජ / සංස්කෘතික / ආර්ථික සහ දේශපාලන වටපිටාව තුළ ඇසෙන දකින සිදුවීමක් / කරුණක් ඇසුරෙන් ඉහත 4(අ) I, II, III සහ IV හි සඳහන් කරන ලද කුසලතා මැන බැලීම සිදු කරන අතර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත යොමු වීමට පෙර මුද්‍රා තැබූ කවරයක බහාලන සිද්ධි සංචිතයක් අතුරින් එකක් තෝරා ගැනීමේ අවස්ථාව ඔබට ලැබෙන අතර ඒ සඳහා සූදානම් වීමට මිනිත්තු 15ක කාලයක් ලබා දෙනු ඇත. ඒ අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඉහත ලැයිස්තුගත කරන ලද කුසලතා මැන බැලීම සඳහා ඔබ වෙත ප්‍රශ්න යොමු කරනු ලැබේ.

(ඇ) මීට අමතරව සම්මුඛ පරීක්ෂණයට ප්‍රවේශ වන ආකාරය සහ සමස්ත සම්මුඛ පරීක්ෂණය පුරා දක්වන ඉදිරිපත් කිරීම අනුව ද ඉහත 4(අ) හි III සහ IV ලෙස ලැයිස්තුගත කරන ලද කුසලතා මැන බැලීම සිදු කරනු ලැබේ.

05. නියමිත දින මෙම සාමාන්‍ය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණවලට සහභාගි නොවන්නේ නම් ඒ සඳහා වෙනත් දිනයක් ලබා නොදෙන හෙයින්, එවැනි ඉල්ලීම් සලකා නොබලන බව ද, අදාළ සහතික සම්මුඛ පරීක්ෂණයට සහභාගි වන අවස්ථාවේ දී අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතු බව ද අවධාරණය කරමි.

06. සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන පරිශ්‍රය තුළට ගමන්මලු, ජංගම දුරකථන සහ වෙනත් විද්‍යුත් සන්නිවේදන උපකරණ රැගෙන යාමට අවසර ලබා නොදෙන බවද දන්වා සිටිමි.

07. තවද, සම්මුඛ පරීක්ෂණයට සහභාගි වීම වෙනුවෙන් ගමන් වියදම් හෝ කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය